# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 18 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා (අංක 2) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූනි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි    තැපැල් ගාස්තුව: ශත 15 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 18 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා (අංක 2) පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 45/77.

**ඇතැම් වර්ගවල කම්කරුවන්ට සේවායෝජකයන් විසින් අයවැය සහන දීමනාවක් ගෙවනු ලැබීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 18 දරන කම්කරුවන්ගේ අයවැය සහන දීමනා (අංක 2) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර (මෙහි මින් මතු " අදාළ දිනය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1977 පෙබරවාරි මස දහහත් වන දින එය ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා නියම බලධරයා වන්නේ ය.

නියම බලධරයා.

(2) මේ පනතින් නියම බලධරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කටයුත්තක් හෝ කාර්යයක් කම්කරු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු වෙත ඒ බලධරයා විසින් පවරනු ලැබිය හැකි ය.

**3.** (1) කම්කරුවන් විසිපස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් කර්මාන්තයක සෑම සේවායෝජකයකු විසින් ම, මාසය සඳහා මුළු ඉපයුම රුපියල් අටසියය නොඉක්මවන එක් එක් කම්කරුවාට එක් එක් මාසය වෙනුවෙන් " අයවැය සහන දීමනාව " යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන රුපියල් පහළොවකට නොඅඩු දීමනාවක් අදාළ දින සිට ගෙවනු ලැබිය යුතු ය :

අයවැය සහන දීමනාව.

එසේ වුව ද—

(අ) ඒ සේවායෝජකයා තේ වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි හෝ රබර් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි හෝ කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තයෙහි හෝ පොල් වැවීමේ කර්මාන්තයෙහි හෝ කුරුඳු හෝ දුම්කොළ කර්මාන්තයෙහි සේවායෝජකයකු වන අවස්ථාවක, එක් එක් කම්කරුවාට ගෙවිය යුතු අයවැය සහන දීමනාව, මාසය තුළ දී ඒ කම්කරුවා වැඩ කර ඇති දින ගණන සඳහා වේතනය වශයෙන් ඒ කම්කරුවාට ගෙවිය යුතු ප්‍රමාණයෙන් සියයට හයක් හෝ රුපියල් පහළොවක් යන දෙකින් අඩු මුදල විය යුතු අතර, ඒ සේවායෝජකයා විසින් සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවන් ගණන නොසලකා එම දීමනාව ගෙවනු ලැබිය යුතු ය ; තව ද

(ආ) එම සේවායෝජකයා සමුපකාර සමිතියක් වන අවස්ථාවක එම සමුපකාර සමිතිය විසින් සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවන් ගණන නොසලකා අයවැය සහන දීමනාව ගෙවිය යුතු අතර, අනියම් කම්කරුවකු සම්බන්ධයෙන් වූ විට එම දීමනාව ඔහු ඒ මාසය තුළ වැඩ කර ඇති දින ගණනේ අනුපාතය අනුව විය යුතු ය.

2—ඒ 33056—11,830 (78/04)

(2) කෑලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව හෝ ගෙවීමේ පදනම මත කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක මේ පනත යටතේ ගෙවිය යුතු අයවැය සහන දීමනාව, අවස්ථාවෝචිත පරිදි, කෑලි ප්‍රමාණය අනුව හෝ දින ප්‍රමාණය අනුව හෝ ගෙවීමේ පදනම මත ඔහුට ගෙවිය යුතු වේතනයෙන් සියයට හයකට නොඅඩු මුදලක් විය යුතු ය. එසේකුදු වුවත් මේ උපවගන්තිය යටතේ ගෙවිය යුතු ප්‍රමාණය මාසයකට රුපියල් පහළොවක් නොඉක්මවිය යුතු ය.

(3) මාසය සඳහා මුළු ඉපයුම රුපියල් අවසියයක් ඉක්මවන, එහෙත් රුපියල් අටසිය අනුවකට අඩු කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම, රුපියල් අටසිය අනුව හා ඒ කම්කරුවා විසින් ඒ මාසය සඳහා ලබාගන්නා වැටුප හෝ වේතනය හා අතර ඇති වෙනයට සමාන මුදලක්, එක් එක් මාසය වෙනුවෙන් අයවැය සහන දීමනාව වශයෙන් ඒ කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අයවැය සහන දීමනාව—

(අ) 1967 අංක 5 දරන සාමූහික ගිවිසුම අදාළ වන ;

(ආ) (අ) ඡේදයෙහි සඳහන් සාමූහික ගිවිසුම යටතේ ගෙවිය යුතු ප්‍රමාණයට වඩා අඩු වාසි සහගත නොවන වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් සේවායෝජකයා විසින් ස්වේච්ඡාවෙන් හෝ අන්‍යාකාරයකින් ගෙවනු ලබන ;

(ඇ) කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය අනුව නිශ්චය කරන ලද ජීවන වියදම් දීමනාවක් සේවායෝජකයා විසින් ගෙවනු ලබන ;

(ඈ) 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වන වගන්තිය යටතේ අනුමත පුණ්‍යායතනයක් වශයෙන් ප්‍රකාශිත ආයතනයක සේවයෙහි නියුක්තව සිටින ;

(ඉ) යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවන්ගේ සම්පූර්ණ සංඛ්‍යාව විසිපස් දෙනකුට අඩු වන අවස්ථාවක, 1971 සැප්තැම්බර් මස 10 වන දින හා අංක 14,975 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ යම් සාමූහික ගිවිසුමක් පිළිබඳව කාර්මික ආරාවුල් පනතේ 10 (2) වන වගන්තිය යටතේ වූ නියමයකින් ඒ සේවායෝජකයා බැඳී ඇති හා ඒ සේවායෝජකයා විසින් එබඳු යම් ගිවිසුමක් ප්‍රකාර වේතන සහ අනාවර්ත ජීවන වියදම් පාරිතෝෂිකයක් ගෙවනු ලබන

කම්කරුවකුට ගෙවනු නොලැබිය යුතු ය.

වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද මේ පනත වලංගු හා බල සහිත විය යුතු බව.

4. වෙනත් යම් ලිඛිත නීතියක හෝ වාචිකව වූ හෝ, ලිඛිත වූ හෝ, ප්‍රකාශිත වූ හෝ, ගම්‍යමාන වූ හෝ, යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන් වුව ද මේ පනතේ විධිවිධාන වලංගු හා බල සහිත විය යුතු ය ; තව ද ඒ අනුව මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම හා අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති අවස්ථාවක, ඒ නොගැලපීමේ ප්‍රමාණය අනුව මේ පනතෙහි විධිවිධාන ඒ වෙනත් යම් නීතිය හෝ ගිවිසුම අභිභවා බලපැවැත්විය යුතු ය.

සේවා නියුක්තිය නොකඩවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

**5.** අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි, යම් සේවායෝජකයකු විසින් මේ පනතේ සඳහන් කර්මාන්ත අතුරින් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති නුපුහුණු කම්කරුවකු ද ඇතුළුව සෑම කම්කරුවකු ම ඒ සේවායෝජකයාගේ කම්කරුවකු වශයෙන් ඔහු නොකඩව සේවය කරන තාක් කල්, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ කම්කරුවා භුක්ති විඳිමින් සිටි, නමුත් මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදන ලද හදිසි අවස්ථා නියෝග යටතේ ඔහුට ගෙවනු ලැබූ යම් දීමනා නොවන වැටුප්වලට, දීමනාවලට හෝ කවර නාමයකින් හෝ අභිධානයකින් හෝ හඳුන්වනු ලබන මුදලින් කරන ලද වෙනත් ගෙවීම්වලට අදාළ නියම හා කොන්දේසිවලට නොඅඩු වාසි සහගත තත්ත්වයෙන් යුත් නියම හා කොන්දේසි මත, ඒ සේවායෝජකයා විසින් එසේ නොකඩවා සේවයෙහි නියුක්ත කරනු ලැබිය යුතු අතර මේ පනතේ ඉහත සඳහන් විධිවිධාන යටතේ ගෙවිය යුතු දීමනා එම වැටුප්වලට, දීමනාවලට හෝ වෙනත් ගෙවීම්වලට අතිරේකව විය යුතු ය.

සේවායෝජකයන් විසින් වාර්තා තබා ගැනීම.

**6.** (1) යම් කර්මාන්තයක කම්කරුවකුගේ සේවායෝජකයකු විසින්, ඒ කර්මාන්තයේ සේවයෙහි නියුක්ත කර ගෙන ඇති කම්කරුවන් සම්බන්ධයෙන්—

(අ) සේවයෙහි නියුක්ත කර ගෙන ඇති එක් එක් කම්කරුවාගේ නම ;

(ආ) ඒ එක් එක් කම්කරුවා විසින් ඉටු කරනු ලබන වැඩයේ වර්ගය ; සහ

(ඇ) මේ පනතේ විධිවිධානවලට අනුව ඒ එක් එක් කම්කරුවාට ගෙවනු ලබන මුදල

දැක්වෙන ලේඛනයක්, ඒ කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන්නේ යම් ස්ථානයක ද, ඒ ස්ථානයෙහි තබා ගෙන පවත්වා ගෙන යා යුතු ය.

(2) සේවායෝජකයකු වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් වාර්තාවක් පවත්වා ගෙන යන්නා වූ හෝ, පවත්වා ගෙන ගිය හෝ සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ එම වාර්තාව පවත්වා ගෙන යාමට නියම වූයේ යම් දිනයක සිට ද ඒ දිනයෙහි සිට අවුරුදු හතරක කාලයක් එම වාර්තාව සුරක්ෂිතව තබා ගත යුතු අතර, පරීක්ෂා කිරීම සඳහා එම වාර්තාව ඉදිරිපත් කරන ලෙස සහ එම වාර්තාවේ සත්‍ය පිටපතක් සපයන ලෙස හෝ එවැනි පිටපතක් සාදා ගැනීමට ඉඩ සලසන ලෙස හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබූ විට. එසේ කළ යුතු ය.

නියම බලධරයාගේ බලතල.

**7.** නියම බලධරයාට—

(අ) යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් පරීක්ෂා කිරීමෙන් හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා හෝ මේ පනතෙහි සඳහන් කම්කරුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් ස්ථානයකට, දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළුවී එම ස්ථානය පරීක්ෂා කිරීමට ; හෝ

(ආ) තමා එම ස්ථානය පරීක්ෂා කරන විට පරීක්ෂා කිරීම සඳහා එවැනි යම් වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක, ඒ ලේඛනය හෝ වාර්තාව නියමිත පසු දිනයක දී පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයේ දී හෝ තම කාර්යාලයේ දී ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ; හෝ

(ඇ) එවැනි යම සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එගි යම කොටසක හෝ පිටපත් ගැනීමට ; හෝ

(ඈ) එම ස්ථානයේ දී තමාට දක්නට ලැබෙන්නා වූ ද ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම කර්මාන්තයක යෙදී සිටින සේවායෝජකයකු යයි නැතහොත් ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති කම්කරුවකු යයි විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇත්තා වූ ද යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමට ; හෝ

(ඉ) මේ පනත අදාළ වන යම් සේවායෝජකයකුට—

(i) එවැනි යම සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින සියලු ම කම්කරුවන්ට හෝ ඒ කම් කරුවන්ගෙන් සමන්විත යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අදාළ වන්නා වූ ද මේ පනතේ කාර්ය සඳහා තමා විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් වන්නා වූ ද වාර වාර්තාවක් ;

(ii) එවැනි යම සේවායෝජකයකු විසින් සපයනු ලබන යම් වාර වාර්තාවක සඳහන් යම විස්තර සම්බන්ධයෙන් තමා නියම කරන තොරතුරක් හෝ පැහැදිලි කිරීමක් ; හෝ

(iii) එවැනි යම සේවායෝජකයකු විසින් පවත්වා ගෙන යනු ලබන යම සම්පූර්ණ ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම කොටසක සත්‍ය පිටපතක්

නිශ්චිත දිනයක දි හෝ ඉන් පෙර තමා වෙත සපයන ලෙස ලියවිල්ලකින් විධාන කිරීමට

බලය ඇත්තේ ය.

වැරදි හා දණ්ඩන.

**8.** අදාළ දිනයෙහි හෝ ඉන් පසුව—

(අ) 6 වන වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින ; හෝ

(ආ) 7 වන වගන්තිය යටතේ යම ඇතුළුවීමක් හෝ පරීක්ෂා කිරීමක් සඳහා හෝ නියම බලධරයාගේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ අවශ්‍ය ලෙස ඔහුට වුවමනා වන්නා වූ විධි සැලසීම පැහැර හරින ; හෝ

(ඇ) 7 වන වගන්තියෙන් පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඒ බලධරයාට බාධා කරන හෝ ගිරිහැර කරන ; හෝ

(ඈ) 7 වන වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ බලධරයා තමාට නියම කරන යම ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඉ) යම වැදගත් විස්තරයක් සම්බන්ධයෙන් සාවද්‍ය වන්නා වූ, යම් ලේඛනයක් හෝ වේතන පිළිබඳ වාර්තාවක් පිළියෙළ කරන හෝ පිළියෙළ කරනු ලැබීමට සලස්වන නැතහොත් 7 වන වගන්තියෙන් පවරා ඇති බලතල යටතේ ක්‍රියා කරන එම බලධරයා වෙත යම් ලේඛනයක් හෝ වාර්තාවක් එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන නැතහොත් දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ හරින ; හෝ

(ඊ) 7 වන වගන්තිය යටතේ එම බලධරයා විසින් දෙන ලද යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ, එකී 7 වන වගන්තිය යටතේ වාර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට, සාවද්‍ය වාර වාර්තාවක් හෝ යම් සාවද්‍ය ප්‍රකාශයක් ඇතුළත් වාර වාර්තාවක් හෝ දන දනම ඉදිරිපත් කරන හෝ සපයන හෝ ඉදිරිපත් කරනු ලැබීමට හෝ සපයනු ලැබීමට සලස්වන

සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

*මේ පනත යටතේ ලැබිය යුතු ගෙවීම කම්කරුවකුගේ වේතනවල කොටසක් විය යුතු බව.*

9. 3 වන වගන්තිය යටතේ කම්කරුවකුට ලැබිය යුතු යම මුදලක් යම ලිඛිත නීතියක සියලු කාර්ය සඳහා හෝ නොඑසේව ඔහුගේ වේතනවල කොටසක් වන බව සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එවැනි කම්කරුවකුගේ සෑම සේවායෝජකයකු විසින් ම එම කම්කරුවාගේ වේතන ගෙවීමට තමා යටත් වන කාලපරිච්ඡේදය ඇතුළත එම මුදල ගෙවිය යුතු ය.

*කම්කරුවන්ට ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැරීම.*

10. (1) මේ පනත යටතේ තමාගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති මුදලක් ගෙවීම පැහැර හරින යම් සේවායෝජකයකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් සේවායෝජකයකුගේ කම්කරුවකුට ගෙවිය යුතු ලෙස නියම කරනු ලැබ ඇති යම් මුදලක් ගෙවීම ඒ සේවායෝජකයා පැහැර හැරීමේ හේතුවෙන් වූ වරදක් සම්බන්ධයෙන් ඒ සේවායෝජකයා මහේස්ත්‍රාත් අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට, අධිකරණය විසින්, එම වරද සඳහා ඒ අධිකරණය විසින් නියම කළ හැකිව තිබූ වෙනත් යම් දණ්ඩනයකට අතිරේකව, ආඥාවේ සඳහන් කාලයක් ඇතුළත ඒ මුදල ඒ කම්කරුවාට ගෙවන ලෙස එම සේවායෝජකයාට ආඥා කරනු ලැබිය හැකි ය ; තව ද ඒ මුදල එසේ නොගෙවනු ලැබුවහොත් ඒ මුදල අධිකරණය විසින් නියම කරන ලද දඩයක් මෙන් අධිකරණයේ ආඥාව පිට අයකර ගනු ලැබ ඒ කම්කරුවාට ගෙවනු ලැබිය හැකි ය.

*නියෝග.*

11. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ දී හෝ නියෝගයේ සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින්, අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ

අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**12.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"සාමූහික ගිවිසුම" යන්නෙහි කාර්මික ආරාවුල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"කොමසාරිස්වරයා" යන්නෙන් තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ සහකාර කම්කරු කොමසාරිස්වරයකු වශයෙන් හෝ කම්කරු නිලධරයකු වශයෙන් හෝ තත් කාලයෙහි ධුරය දරන යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ ;

"සමුපකාර සමිතිය" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරන ලදැයි සලකනු ලබන සමුපකාර සමිතියක් අදහස් වේ ;

"ඉපයීම" යන්නෙහි 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සේවායෝජකයා" යන්නෙන් යම් කර්මාන්තයක, තමා වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරන යම් තැනැත්තෙක් හෝ, වෙනත් යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර යම කර්මාන්තයක වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ ;

"කර්මාන්තය" යන්නට සේවායෝජකයකු විසින් හෝ කම්කරුවකු විසින් හෝ පවත්වා ගෙන යනු ලබන, ඉටු කරනු ලබන හෝ කරගෙන යනු ලබන යම් කාර්මික ව්‍යාපාරයක්, වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරයක්, ව්‍යාපෘතියක්, වෘත්තියක් හෝ ජීවනෝපායක් සහ යම් කර්මාන්තයක යම් අංශයක් හෝ ප්‍රබන්ධක යම් කටයුත්තක් හෝ ක්‍රියාවලියක් ඇතුළත් වන නමුත්, සේවායෝජකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම ප්‍රාග්ධනය සපයනු ලැබූ යම් සංස්ථාගත හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් විසින් පවත්වා ගෙන යනු ලබන හෝ ප්‍රධාන වශයෙන් බාල්‍යාපරාධකරුවනට හෝ අනාථ දරුවනට හෝ අසරණ, ගොළු, බිහිරි හෝ අන්ධ තැනැත්තන්ට කාර්මික පුහුණුවක් ලබා දීමේ කාර්යය සඳහා පවත්වා ගෙන යනු ලබන යම් කර්මාන්තයක්, වෙළෙඳ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාරයක් ඊට ඇතුළත් නොවේ ; තව ද

"කම්කරුවා" යන්නෙන් යම් කර්මාන්තයක, කාර්මික ව්‍යාපාරයක, වෙළෙඳ ව්‍යාපාරයක, ව්‍යාපෘතියක හෝ ජීවනෝපායක යම් වැඩක් වාචික වූ හෝ ලිඛිත වූ හෝ ප්‍රකාශිත වූ හෝ ගම්‍යමාන වූ හෝ ගිවිසුමක් යටතේ කිරීමට යම් සේවායෝජකයකු විසින් සේවයෙහි නියුක්ත කර ඇති තැනැත්තකු අදහස් වන අතර එයට යම් ලිඛිත නීතියකින් හෝ අන්‍යාකාරයකින් වැටුප් හෝ වේතන විධිමත් කරනු ලැබූ කම්කරුවකු සහ කැලි ප්‍රමාණය අනුව ගෙවීමට සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු ඇතුළත් වන නමුත්, ගෘහසේවකයකු හෝ සේවායෝජකයකුගේ පෞද්ගලික රියැදුරකු හෝ එයට ඇතුළත් නොවේ.